## 1.1 වර්තමාන ලාංකේය සමාජය පශ්චාත් නූතන සමාජයක් ද ?

කුලතිලක කුමාරසිංහ
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

පශ්චාත් නූතනවාදීන් විසින් පශ්චාත් නූතන සමාජයක ලක්ෂණ කෙබඳු දැයි පැහැදිලි කරනු ලැබ ඇත. එකී ලක්ෂණවල එල්බ ගන්නා ඔවුහු මේ වන විට මෙරට පශ්චාත් නූතන සමාජ තත්වයක් ගොඩ නැගී ඇතැයි පවසති. අපේකම, අපේ උරුමය, ජාතිකත්වය පිළිබඳ ආකල්ප සමාජයේ වැඩි පිරිසක් අතින් ගිලිහී යන බවක් දක්නට ලැබේ. ගෝලීයකරණය තුළ අපේ උරුමය ගැන කතා කිරීම විහිළුවක් ලෙස ඔවුහු දකිති. ඉතිහාසය ද ඔවුන් විසින් ප්‍රශ්න කරනු ලැබේ. හැම ක්ෂේත්‍රයක දී ම සම්ප්‍රදාය අභියෝගයට ලක් කිරීමට, අතික්‍රමණය කිරීමට, ඛණ්ඩනය කිරීමට ඔවුහු නැඹුරු වී සිටිති. සම්ප්‍රදාය ප්‍රශ්න කිරීමට ලක් කිරීම නූතනවාදයේ ද ප්‍රමුඛ ලක්ෂණයක් විය. **ජේම්ස් ජොයිස් ප්‍රාන්ස් කෆ්කා වර්ජිනියා වුල්ෆ්** බඳු සාහිත්‍යකරුවෝ නවකතා හා කෙටිකතාකරණයේ දී සම්ප්‍රදාය උඩු යටිකුරු කිරීමට උත්සාහ ගත්හ. එහෙත් සම්ප්‍රදාය යෝද පර්වතයක් මෙන් පතුරු ගැලවෙමින් වුව ද රැඳී පවතී. අද වන විට දේශපාලනය මෙන් ම සමාජාර්ථික ක්‍රියාවලිය ද ප්‍රශ්න කිරීමට ලක්වෙමින් පවතී. ආගම, ධර්මය හා සංස්කෘතිය ද ප්‍රශ්න කෙරේ. අතීතයේ ද මේ ක්ෂේත්‍රවල ප්‍රශ්න කිරීම් පැවතුනත් ඒ සුළු පිරිසකගේ ක්‍රියාවලියක් විය. අද බොහෝ දෙනෙක් කණ්ඩායම් වශයෙන් හා සංවිධාන වශයෙන් පෙළ ගැසී සංස්කෘතියේ මූලික අංග ලක්ෂණ මෙන් ම ධර්මතා ප්‍රශ්න කරති. මෙය ජාතියක ස්වාධීනත්වයට බාධාවකි. ජාති හිතෛෂීන් විසින් මේ ස්වභාවය ජාතියේ ස්වායිධිපත්‍යය කෙළෙසීමක් ලෙස දුට ද පශ්චාත් නූතනවාදීහු මෙය පශ්චාත් නූතන තත්වයක් ලෙස දකිති.

අතීතයේ දී ආගම යනු ශ්‍රද්ධාව හා භක්තිය මුසු වූ ක්‍රියාදාමයකි. ශ්‍රද්ධාව හා භක්තිය නොමැතිව ආගමක් නොපැවතිය හැකි බව එදා පිළිගැනීම වූයේ ය. එහෙත් අද අපේ ජනතාව ආගමික නායකයන්ගේ ධර්ම මාර්ගය මෙන් ම ජීවන මාර්ගය ද ප්‍රශ්න කරන බව පෙනෙන්නට තිබේ. ආගමික නායකයෝ පවා ආගම් විවේචනය කරති. අතීතයේ දී ඉතාමත් ගරු ගම්භීර ලෙස පැවැති ආගමික ප්‍රතිරූප ඒ තත්වයෙන් යම් ආකාරයක ප්‍රපාතයකට ඇද දමනු ලැබ තිබේ. අද බොහෝ දෙනා පුද පූජා සිදු කරන්නේ විලාසිතාවක් ලෙසිනි. මෙය ද පශ්චාත් නූතන තත්වයක් ලෙස පශ්චාත් නූතනවාදීහු සලකති.

රටකට ස්ථිර දේශපාලන හා අර්ථික පදනමක් පැවතිය යුතුය. එවැනි තත්වයක් අද පවතී ද ? නිෂ්පාදනයට වඩා පරිභෝජනය ඇගයීම පශ්චාත් නූතන සමාජයක ලක්ෂණයකි. අද මේ රටේ දක්නට ඇත්තේ එය නොවේ ද ? අතීතයේ දී කෘෂිභෝග නිෂ්පාදනයට ප්‍රමුඛත්වයක් හිමි විය. අද වෙළෙඳ පොළේ ඇත්තේ අපේ රටේ වගා කරන දේ නොවේ. ස්වාභාවික ආහාරවලට වඩා බහු ජාතික සමාගම් විසින් නිෂ්පාදනය කෙරෙන කෘත්‍රිම ආහාරවලට මිනිස්සු හුරුපුරුදු වී සිටිති. වී ගොවීන්ගේ අස් වැන්නට අද මිලක් නැත.

විලාසිතා සමාජ රෝගයක් බවට පත්ව ඇත. සතියෙන් දෙකෙන් ගැල වී යන සිනමා සිතුවම් මෙන් විලාසිතා ද කෙටි කලකින් වෙනස් වී යයි. කාන්තාවෝ යටි ඇඳුම් ප්‍රදර්ශනය කෙරෙන - විනිවිද පෙනෙන විවිධාකාර ඇඳුම් පරිහරණය කරති. ලිංගික උත්තේජනය ද ඇති කරන ඇඳුම් පැළඳුම් භාවිතය නිසා කාන්තාවන් අපසරණය කිරීම සමාජගත ලක්ෂණයක් බවට පත් වී ඇත. තරුණ තරුණයන්ගේ ලිංගික චර්යාවල පෙර පැවැති ශික්ෂණය අද ගිලිහී ගොස් ඇත. මේ සදාචාර පැවැත්මේ - බටහිරීකරණයේ - ගෝලීය කරණයේ ප්‍රතිඵලයක් ද ? මේ සමාජ පිරිහීම නීසා සිදු වන්නක් ද ? නැතහොත් මේ පශ්චාත් නූතන තත්වයද ?

**ටෙනිසන් පෙරේරා, සුනන්ද මහේන්ද්‍ර** බඳු සාහිත්‍යකරුවන් **භූතාත්ම, නිරුවත් දෙවිවරු, ඡායා ප්‍රාන්තය** බඳු නවකතා මගින් නිරූපණය කර ඇත්තේ මේ සමාජ තත්වයද ? මේ නවකතාවලින් ඔවුන් දකින හා හඟින පශ්චාත් නූතන සමාජය නිරූපණය වන්නේ ද ? නැතහොත් පශ්චාත් නූතන සාහිත්‍ය චින්තා - ලක්ෂණ කෘත්‍රිම ලෙස නවකතාවලට ඇතුළත් කර තිබේ ද සාහිත්‍ය නිර්මාණයක අගය රඳා පවතින්නේ විශ්වසනීයත්වය හා අව්‍යාජත්වය මතය. මේ ධර්මතා දෙක නොරැකෙන කෘතිය සාහිත්‍ය නිර්මාණයක් නොව වෙනයම් විකෘතියකි.